# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2273/88 – 2022 අප්‍රේල් මස 02 වැනි සෙනසුරාදා – 2022.04.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2020 අංක 147 දරන ආඥාව**

ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 4-3/9/2015/IR/307-E.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 4-3/2/3/ව. ප. ඇ./ICB 02.

අංක 2194/46 හා 2020.09.23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකර ඇති 2020 අංක 147 දරන 38(අ) ආඥාවේ මගේ යොමු අංකය 4-3/9/2015/IR/307J ලෙස සඳහන් වී ඇති බැවින් එය 4-3/9/2015/IR/307E ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් කාරුණිකව දන්වමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2022 මාර්තු මස 29 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 04 – 0011

### ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2020 අංක 146 දරන ආඥාව**

ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 4-3/9/2015/IR/307-E.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 4-3/2/3/ව. ප. ඇ./ICB 02.

අංක 2194/46 හා 2020.09.23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකර ඇති 2020 අංක 146 දරන 38(අ) ආඥාවේ මගේ යොමු අංකය 4-3/9/2015/IR/307J ලෙස සඳහන් වී ඇති බැවින් එය 4-3/9/2015/IR/307E ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් කාරුණිකව දන්වමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2022 මාර්තු මස 29 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 04 – 0012


1A – G 36540 – 30 (2022/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2022 අංක 95 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/9/2015/IR/307E.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 4-3/2/3/ව.ප.ඇ./ICB 02.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට *නැතහොත්,* එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2022 මාර්තු මස 29 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.–** ප්‍රාදේශීය ලේකම්, ගලේවෙල.

2. **ඉඩමේ විස්තරය.–** මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දපල්ල කෝරළේ සුළු කොට්ඨාසයේ, අංක E 432C, දඹුයාය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ගලේවෙල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අවසාන ගම් පිඹුරු අංක 346, අතිරේක අංක 75 හා පත්‍ර අංක 69 හා 2017.11.24 දිනැති අවසාන ගම් පිඹුරෙහි සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අංක 1678 – සියඹලාගහමුල කනත්ත – ප්‍රමාණය: හෙක්. 0.0006**

උතුරට: කැබලි අංක 1676 සහ 1675; නැගෙනහිරට: කැබලි අංක 1679 සහ 1681; දකුණට: කැබලි අංක 1681; බටහිරට: කැබලි අංක 373, 1677 සහ 1676.

EOG 04 – 0013